**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**
**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 16දිනද, සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවට අයත් අරලගංවිල සතිපොළ ඉඩමෙහි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම්,වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | පොත්වලින් මගහැරී ඇති ඉඩම්වල වටිනාකම් ගිණුම්වල ඇතුළත් කිරිමට කටයුතු කරමි. |
| (ii) | 2013 වර්ෂයේදී ඉදිකල අරලගංවිල නව මාළු වෙළඳසැලෙහි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම්, වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉඩම් අයිතිය සභාව සතු නොවන අතර ඉඩම් පවරාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. |
| (iii) | සභාවට අයත් ක්‍රීඩා පිටි 60 ක සහ සුසාන භූමි 56 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | ඉඩම් පවරාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි. | වෙන්කිරීම් සිදුකල යුතු වේ. | 2019 වර්ෂයේදී නිවැරදි කර ගනිමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ ජල ගාස්තු ශේෂය සහ ජල ව්‍යාපෘති මඟින් සකස් කල හිඟ ජල ගාස්තු උපලේඛන අතර රු.866,745 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | සොයාබලා නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| **(ii)** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සේවක ණය උපලේඛනය සහ ශේෂ පත්‍රයේ එම වටිනාකම අතර රු.34,793 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී වෙනස නැතිකර ගැනීමට කටයුතු කරමි. |
| **(iii)** | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති වියදම් ණයහිමි උපලේඛනය සහ ශේෂ පත්‍රයේ එම වටිනාකම අතර රු.590,000 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම තුළ නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**(ඇ)** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.416,622,155 ක් වූ ගිණුම් විෂයන් 09 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය ආරම්භ කර ඇත. එය අවසන් වූ වහාම වත්කම් සමීක්ෂණය පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර ඉදිරිපත් නොකල ලේඛන නඩත්තු කිරීමට විෂය ලිපිකරුවන් දැනුවත් කර ඇත. |

**1.4** අනුකූල නොවීම

-------------------
නීතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
-------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | වටිනාකම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | | රු. | | |
| **(අ)** | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ආයතන හදුනාගෙන පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. | - | බල ප්‍රදේශය තුළ පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හදුනාගෙන බලපත්‍ර ලබාදිය යුතු වේ. | ආයතන හදුනාගෙන පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත . |
| **(ආ)** | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | | |
| **(i)** | රීති අංක 19 | උප පත්‍රිකා පොත් 16 ක් ආපසු භාරනොදුන් නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | - | අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | එම පොත් භාරදෙන ලෙසදන්වා ඇත . |
| **(ii)** | රීති අංක 59 - 63 | සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කරනොතිබුණි. | - | වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලැයිස්තු පිළියෙල කර ඒ අනුව ගාස්තු අයකළ යුතුවේ. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(iii)** | රීති අංක 203 | සභාවේ දේපල පිළිබඳව 2018 වර්ෂය වෙනුවෙන් සමීක්ෂණ කටයුතු කර නොතිබුණි. | - | රීති ප්‍රකාරව සමීක්ෂණ කටයුතු සිදුකල යුතු වේ. | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මේ වන විට ආරම්භ කරඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත රීති හා 2018 අගෝස්තු 29 දිනැති අංක 2086/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ නියෝග අංක 1.1 | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා මාසවල සභාපතිවරයාගේ නිල වාහනය සඳහාඅනුමත ඉන්ධන සීමාව ඉක්මවා ලීටර් 530 ක් යොදවා රු. 60,880 ක් වැයකර තිබුණි. | 60,880 | අනුමත සීමාව තුළ අදාල වියදම් දැරිය යුතු අතර, වැඩිපුර දැරූ වියදම් අයකරගත යුතු වේ. | ප්‍රාදේශීය සභා කාර්යාල බල ප්‍රදේශයේ ආරම්භයේ පිහිටා තිබීම, ජල ව්‍යාපෘතිවල අධීක්ෂණය සභාවේ කටයුතු සඳහා කොළඹට හා අනුරාධපුරයට යාමට සිදුවීම නිසා සීමාව ඉක්මවා ඇත. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ<br>---------------------- | | | | |
| | 2015 දෙසැම්බර් 04 දිනැති අංක NCP/LG/AC/04/01/02 දරන ලිපිය | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා මාසවල ලේකම්වරයා වෙත අනියුක්ත කර තිබූ වාහනය සඳහා අනුමත ඉන්ධන සීමාව ඉක්මවාඉන්ධන ලීටර් 589 ක් යොදවා රු.55,955 ක් වැයකර තිබුණි. | 55,955 | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතිය ලබාගැනීම සිදුකල යුතු වේ. | ප්‍රාදේශීය සභා කාර්යාල බල ප්‍රදේශයේ ආරම්භයේ පිහිටා තිබීම, ජල ව්‍යාපෘති 4 හි අධීක්ෂණය, රැස්වීම් කටයුතු සඳහා සහභාගී වීම නිසා සීමාව ඉක්මවා ඇත. |

**1.5** ලැබිය යුතු ගිණුම්
-------------------

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------- |
|---|---|---|---|
| (අ) | මූලා‍ ප්‍රකාශනවල දක්වා ඇති වර්ෂ 02 සිට වර්ෂ 08 දක්වා වූ කාල පරාසයක සිට පැවත එන එකතුව රු.246,020 ක් වූ හිඟ කඩකාමර කුලී මුදල් සමාලෝචිත වර්ෂය තුළදීද අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු සලසා ඇති අතර නීත්‍යානුකූලව පවරා ගැනීමටත් අනතුරුව නීතිමය |

| | | | |
|---|---|---|---|
| | | | පියවර ගැනීමට තීරණය කර ඇත. |
| **(ආ)** | මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබෙන2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරාසයට අදාල එකතුව රු.1,000,023 ක සතිපොළ බදු ආදායම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | දැනට නීති කටයුතු සිදුකිරීම සඳහා නීතිඥ උපදෙස් ලබාගෙන ඇත . |

**1.6** ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට වසර 03 කට අධික කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල පැවත එන රු.1,954,698 ක් වූ ඕවර්සියර් ගබඩා තොග ශේෂය අනුමැතියකින් තොරව ජ'නල් සටහනක් මඟින් ගිණුම්වලින් කපාහැර තිබුණි. | පරීක්ෂණයක් පවත්වා සුදුසු ශේෂයන් පමණක් කපා හළ යුතු වේ. | වරද නිවැරදි කර ගැනීමට 2019 වසර ගිණුම් තුළ කටයුතු කරමි. |

**2** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,869,194 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,190,619 ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 23,561,440 | 23,252,875 | 21,989,794 | 9,709,245 | 1,707,200 | 22,580,755 | 21,187,709 | 8,446,164 |
| කුලී | 7,874,700 | 3,989,520 | 3,360,008 | 1,384,067 | 9,509,256 | 3,633,389 | 3,519,609 | 1,383,203 |
| බලපත්‍ර ගාස්තු | 528,000 | 534,670 | 439,670 | 2,160,779 | 844,500 | 574,686 | 585,126 | 2,065,779 |
| වෙනත් ආදායම් | 14,988,550 | 16,806,291 | 6,161,362 | 24,305,423 | 9,187,400 | 13,192,685 | 6,178,676 | 13,660,545 |
| එකතුව | 46,952,690 | 44,583,356 | 31,950,834 | 37,559,514 | 21,248,356 | 39,981,515 | 31,471,120 | 25,555,691 |

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් රු. 46,952,690 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, රැස්කර තිබූ ආදායම රු. 31,950,834 ක් වූ අතර, එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 68 ක් වී තිබුණි. | ඇස්තමේන්තුගත ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කල යුතු වේ. | සංවර්ධන කටයුතු සඳහා සභාව සතු වාහන යොදාගැනීම නිසා ,වාහන කුලියට ලබාදීමෙන් රැස්කිරීමට බලාපොරොත්තු වූ ආදායම ලබාගැනීමට නොහැකි විය. |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව මඟින් ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 04 හි හිඟ ජල ගාස්තු ආදායම රු. 9,709,245 ක අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. | හිඟ මුදල් අයකිරීමට ලිඛිතව උපදෙස් ලබාදී ඇත. |

**2.2.3** බදුකුලී

--------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ---------------------- | ----------- | ---------------- |
| බදු දීමේදී ගිවිසුම්වලට එළඹ නොතිබීම නිසා සභාව සතු කඩ කාමර 04 කින් අයකර ගත යුතු කුලී රු. 123,950 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හිඟව පැවතුණි. | බදු දීමේදී ගිවිසුම් අත්සන් කළ යුතු අතර හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. | හිඟව ඇති මුදල ගෙවන ලෙසට දැනුවත්කර නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ---------------------- | ----------- | ---------------- |
| උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ මුදල රු. 23,549,923 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම රු. 755,500 ක් වූ අතර, 2018 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන නොතිබුණි. | සියලු උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන සභාව වෙත ලබාගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. | හිඟ උසාවි දඩ මුදල් ලබාගැනීම සඳහා අදාළ ව්‍යාපෘති සකස්කර ඉල්ලුම් කර ඇත. |

**3** මෙහෙයුම් සමාලෝචනය

--------------------------

**3.1** කාර්යසාධනය

----------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු සතිපොළ බදුදීම, ත්‍රී රෝද රථගාල් වලින් ගාස්තු අයකිරීම, ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු, විනෝද බදු, අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ගාස්තු අයකිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදාල අතුරු ව්‍යවස්ථා පනවා එම කටයුතු නියාමනය කර ගාස්තු අයකල යුතු වේ. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරමි. |

**(ආ)** ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 අනුව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසිය යුතුයි. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇත. |

**(ඇ)** කාර්යභාරයන් ඉටුකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ජල ව්‍යාපෘති 04 හි ජල පෙරණවල තිබූ වැලි තට්ටු, මඩ සිරවීම නිසා ඉවත් කර තිබූ බැවින් පාරිභෝගිකයන්ට පිරිපහදු නොවූ, නියමිත ප්‍රමිතියෙන් යුක්ත නොවූ අපිරිසිදු ජලය බෙදාහැර තිබුණි. | පිරිසිදු ජලය සපයා සභාවේ කාර්යභාරය මැනවින් ඉටුකල යුතු වේ. | මේ වන විට සිරිපුර හා නුවරගල ජල ව්‍යාපෘති දෙකෙහි වැලි පෙරණ සකස්කරඇති අතර දිඹුලාගල හා වෙහෙරගල ජල ව්‍යාපෘති දෙකෙහි සංවර්ධන කටයුතු ආරම්භකර ඇත. |

**(ඈ)** සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2012 වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ කසල බැහැර කිරීම සඳහා අක්කර 05 ගොඩ ඉඩම් කොටසක් අරලගංවිල දඹගහ උල්පත ප්‍රදේශයෙන් ලබාදී දැනට වසර 06 කට අධික කාලයක් ගත වී ඇතත් එම ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරාගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |

**3.2** තිරසර සංවර්ධන ඉලක්ක

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණ ද එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. | සභාවේ අරමුණු හඳුනාගත යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| **(ආ)** | අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දිනැති අංක BD/CBD/4/1/2-2018 චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබුණු දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| **(ඇ)** | ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා වූ සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබු බැවින් දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | දත්ත එක්රැස් කිරීමට කටයුතු කළ යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| **(ඈ)** | 2016, 2017 හා 2018 වර්ෂවල තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කළ යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| **(ඉ)** | ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයන් නොපැවති අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | පුහුණු කටයුතු නිසි පරිදි සිදුකළ යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |

**3.3** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්නා ත්‍රී රෝද රථවලින් ගාස්තු අයකිරීමට ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව අතුරු ව්‍යවස්ථා පනවා නීත්‍යානුකූල කිරීමට සභාව කටයුතු නොකිරීම හේතුවෙන් සභාව විසින් දැනට හඳුනාගෙන ඇති ත්‍රී රෝද රථගාල් 06 කින් ගාස්තු අයකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකල යුතු වේ. | ගාස්තු අයකර ගැනීමට ආදායම් පරිපාලකදැනුවත් කරමි. |
| **(ආ)** | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වගන්තිය ප්‍රකාරව දිඹුලාගල බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 07 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 24,000 ක වෙළඳ/ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල බදු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ඇ)** | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින සියලු දැන්වීම් පුවරු ලේඛනගත කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | දැන්වීම් පුවරු ලේඛනගත කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4** මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | ප්‍රාදේශීය සභාවේ ද්විතියික මට්ටමට අයත් සංවර්ධන නිලධාරි තනතුරු 05 ක්, තාක්ෂණික නිලධාරි තනතුරක්, පුස්තකාලයාධිපති තනතුරක්, ආදායම් පරික්ෂක තනතුරක්, පෙර පාසල් ගුරු තනතුරු 02 ක්, ක්ෂේත්‍ර පරික්ෂක තනතුරක් වශයෙන් තනතුරු 11 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කල යුතු වේ. | පුරප්පාඩු පුරවාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත . |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ප්‍රාථමික මට්ටමට අයත් බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරක්, විදුලි කාර්මික තනතුරක්, ජලනල ක්‍රියාකරු තනතුරක්, සෞඛ්‍ය කම්කරු තනතුරක් වශයෙන් තනතුරු 04 ක පුරප්පාඩු හා කාර්යාල කාර්ය සහායක තනතුරක්, පුස්තකාල කම්කරු තනතුරක්, ක්ෂේත්‍ර කම්කරු තනතුරු 05 ක් සහ ජල කාර්මික තනතුරක් වශයෙන් තනතුරු 08 ක අතිරික්තයක් පැවතුණි | පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමටත්, අතිරික්ත විධිමත් කරගැනීමටත් කටයුතු කල යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |
| **(ඇ)** | අයනොවී පවතින රු.331,741 ක සේවක ණය ශේෂයක් ණයකරුගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයකරුගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | හිඟ ණය ශේෂ සම්බන්ධව සොයාබලා අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.5** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ )** | 2018 නොවැම්බර් 08 දින වන විට වෙහෙරගල ජල ව්‍යාපෘතියෙහි ජල මීටර් 72 ක්, සිරිපුර ජල ව්‍යාපෘතියෙහි ජල මීටර් 520 ක්, නුවරගල ජල ව්‍යාපෘතියෙහි ජල මීටර් 405 ක් වශයෙන් ජල මීටර් 997 ක් අක්‍රියව පැවතුණි. | අක්‍රීය ජල මීටර් ඉවත් කර කඩිනමින් නව ජල මීටර් සවිකල යුතු වේ. | ජල මීටර් මිලදීගෙන සවිකිරීමට කටයුතු කරමි. |
| **(ආ )** | කඩ කාමර 12 කින් තාවකාලික තක්සේරුවක් මත හා කඩ කාමර 02 සඳහා කමිටු තීරණයක් මත හා කඩ කාමර 05 කින් 1992 වර්ෂයේ සිදුකල තක්සේරුව මත පදනම්ව කුලිය අයකර තිබුණි. | අවම වශයෙන් වසර 05 කට වරක් තක්සේරු කිරීම් සිදුකල යුතු වේ. | තක්සේරු කිරීම සඳහා සියළු තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2018 අප්‍රේල් මස 05 දිනැති ලිපිය මඟින් භාර දී ඇත |

**3.6** වත්කම් කළමනාකරණය

----------------------------

**(අ)** නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වටිනාකම රු.2,218,961 ක් වූ ගොඩනැගිලි 7 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිශ්කාර්යව පැවතුණි. | උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | එක් ගොඩනැගිල්ලක් අබලන් තත්ත්වයේ පවතින අතර අනෙකුත් ගොඩනැගිලි පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරමි. |

**(ආ)** වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බදුකරු විසින් ටෙන්ඩර් කොන්දේසි කඩකරමින් වසර 05 කට අධික කාලයක් තිස්සේ පවත්වාගෙන යන අරලගංවිල මීරිදිය මාළු කඩය ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය සභාව සතු කර ගැනීමට කටයුතු කල යුතු වේ. | නීති උපදෙස් ලබාගෙන ඉඩම පවරාදෙන ලෙස මහවැලි අධිකාරිය වෙත ලිපි ඉදිරිපත් කර ඇත. |

**3.7** දෘශ්‍ය අක්‍රමිකතා

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහජන උපයෝගිතාවයන් සඳහා 2014 දෙසැම්බර් 16 දින සභාවට ලබාදෙන ලද ගැල්වනයිස් කොඩි | ආපසු ලබාගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මන්ත්‍රීවරුන්ට දැනුම්දුන් නමුත් භාරදී |

| | | | |
|---|---|---|---|
| | කණු 360 ක් හිටපු සභාපතිවරයා හා මන්ත්‍රීවරුන් 05 දෙනෙකු වෙත නිකුත් කර වසර 04 කට අධික කාලයක් ගතව ඇතත් ඒවා ආපසු සභාව වෙත ලබාගෙන නොතිබුණි. | | නොමැත.මේ වන විට අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව මගින් පරීක්ෂණයක්ද සිදුකරයි. |
| **(ආ)** | 2015 පෙබරවාරි 20 දින රු.1,249,880 ක් වැයකර මිලටගෙන තිබූ ඩෙල් වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 10 ක් හා ipad 02 ක් හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 12 දෙනෙකු වෙත නිකුත්කර වසර 3 ½ කට අධික කාලයක් ගතවී ඇතත් ඒවා ආපසු සභාව වෙත ලබාගෙන නොතිබුණි. | සභාවේ වත්කම් ආපසු ලබාගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ලැප්ටොප් ආපසු භාරදෙන ලෙස තෙවන සිහිකැඳවීමද යවා ඇත.එම යන්ත්‍ර ආපසු භාරදීම් මන්ත්‍රීවරුන් විසින් ප්‍රතික්ෂේප කර ඇත. |

**3.8** ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | සියලු කාර්යයන් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට අවධානය යොමුවිය යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. | මාස 02 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කල යුතු වේ. | විගණන කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |